හියුම් සිටි කවුන්සිලය ඉදිරිපත් කරයි

# ලක්මිණි ප්‍රේමතුංග සහ ශිෂ්‍යාවන්ගේ සිත්තම් දැක්ම

## Into the world fantasy







මෙපුරයේ සෑම දිනකම කොතැනක හෝ යම් කිසි කලා කටයුත්තක් සිදුවෙයි. ඒ විවිදාකාර වූ කලා කටයුතු අතර දුලබ කලා කටයුත්තක් මැයි මස පළමුවනදා සිට 24 වනදා දක්වා වික්ටෝරියාවේ බ්‍රෝඩ්මෙඩොස්හි හියුම් සිටි කවුන්සිලයේ ග්ලෝබල් ලර්නිං සෙන්ටර් හිදී පැවැත්වෙයි. ඒ පද්මිණී ප්‍රේමතුග සහ ඇගේ ශිෂ්‍යාවන් ඉදිරිපත් කරන Into the world of Fantasy චිත්‍ර ප්‍රදර්ශනයයි.

**මේ හපන්කම කරන දරු දැරියන් ශ්‍රී ලාංකික අපේ දරුවන් වීම විශේෂත්වයකි.**
**ජිනෙත් තිසේරා, බරීනා ප්‍රනාන්දු, චමති ගමගේ, බ්‍රිවිනි ප්‍රනාන්දු, සදිත් දිසානායක, චනුති ගමගේ, සෙතුකි තිසේරා**

මේ හපන්කම කරන දරුවන් සත්දෙනායි. සිය ගුරුවරිය වූ ලක්මිණී ප්‍රේමතුංගගේ මග පෙන්වීම යටතේ මේ දරුවන් දැරියන් අතින් නිම වුණ අපූරු සිත්තම් පෙළක් මේ ප්‍රදර්ශනයට ඇතුළත් ය. ඒ හපන්කම් වල විශිෂ්ටත්වය හඳුනාගන්නට නම් ඔබේ දෑසින්ම මේ සිතුවම් නැරඹිය යුතු ය.

**ප්‍රදර්ශනය විවෘතව තැබෙන වේලා මෙසේ ය.**
සඳුදා - බ්‍රහස්පතින්දා පෙ.ව:10.00 සිට ප.ව:8.00
සිකුරාදා පෙ.ව:10.00 සිට ප.ව:5.00
සෙනසුරාදා පෙ.ව:10.00 සිට ප.ව:4.00
ඉරිදා ප.ව: 1.00 සිට ප.ව: 4.00

අපේ දරුවන්ගේ මේ හපන්කම් නරඹන්නට යන්නැයි සන්නස පාඨක ඔබෙන් අපි ඉල්ලා සිටින්නේ මේ පිබිදෙන මල් කැකුළු වඩාත් දිරිමත් කිරීම අපේ යුතුකමක් වන බැවිනි.

**සටහන ජගත් ජේ එදිරිසිංහ**

HUME CITY COUNCIL



